දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011 - 2876169
011 - 2876181

විද්‍යුත් තැපෑල
மின் - அஞ்சல்
E - mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

මගේ අංකය
எனது இல.
My No.
PSC/EST/05-01-02/04/2018

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date
2019.01. 17

22 JAN 2019

ලේකම්

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

**වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය**

උක්ත කරුණ හා සම්බන්ධ මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අංක MF1/01/01/03 හා 2018.12.14 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද, එම කොමිෂන් සභාවේ ලේකම්ගේ අත්සනින් යුත් උක්ත බඳවා ගැනීමේ පටිපාටියේ මුල් පිටපත මේ සමඟ එවමි.

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ බඳවා ගැනීමේ පටිපාටිය ඔබ අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළකරන ලෙසත්, අනතුරුව ඒ බව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත වාර්තා කරන ලෙසත් කාරුණිකව දන්වමි.

අත්/කළේ ඩබ්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

AD/ Adm
AO

පිටපත්-

01. ලේකම් - ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව - (මුල් පිටපත මේ සමඟ එවමි)
02. අධ්‍යක්ෂ ජනරාල් - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව - (මුල් පිටපත මේ සමඟ එවමි)
03. ආයතන අධ්‍යක්ෂ ජනරාල් - (මුල් පිටපත මේ සමඟ එවමි)

(22)

# වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය

01. සම්බන්ධ වන ආයතන

| | | | | |
|---|---|---|---|---|
| 1.1 | දෙපාර්තමේන්තුව: | වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති | යොමු අංකය : TIP/ADM/08/10/47(ii) | දිනය: 2018.11.30 |
| 1.2 | අමාත්‍යාංශය: | මුදල් හා ආර්ථික කටයුතු | යොමු අංකය: MF 1/01/01/03 | දිනය : 2018.08.03 |
| 1.3 | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම: | | යොමු අංකය : DMS/1162/Temp | දිනය : 2018.03.22 |
| 1.4 | ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය: | | යොමු අංකය : EST-2/04/REC/9202 | දිනය : 2018.07.03 |
| 1.5 | ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය: | | යොමු අංකය: NSCC/01/07/37/SR | දිනය : 2018.06.21 |
| 1.6 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය: | | යොමු අංකය : PSC/EST/05-01-02/04/2018 | දිනය : 2018.11.01 |

02. පත්කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

03. සේවා ගණය පිළිබඳ විස්තර :

3.1 සේවා ගණය : විධායක

3.2 ශ්‍රේණි : III/II

3.3 පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය :

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ වෙළඳ ප්‍රතිපත්ති අංශය යටතේ තීරු බදු අයකිරීමේ හා නිදහස් කිරීමේ ප්‍රතිපත්ති සැකසීම. ඒ අනුව තීරුබදු සංයුතිය සහ ඊට ආනුෂාංගික අනෙකුත් ආනයන බදු වර්ග සම්බන්ධයෙන් වන ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳව විශ්ලේෂණය කිරීම හා තීරණ ගැනීමට බලපානු ලබන නිර්දේශ ලබා දීම සහ ඒ සම්බන්ධයෙන් වන සංශෝධනයන් සිදු කිරීම.

3.4. කාර්යයන් පැවරීම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැකිය.

04. තනතුරෙහි/ තනතුරු වල ස්වභාවය : ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය.

(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.)

05. වැටුප්

5.1. වැටුප් කේත අංකය : SL 1- 2016

5.2. වැටුප් පරිමාණය : රු. 47,615 – 10 x 1,335 – 8 x 1,630 – 17 x 2,170 – 110,895

5.3. ශ්‍රේණි ක්‍රමයට අදාල ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු) |
|---|---|---|
| III | පියවර 01 | 47,615/- |
| II | පියවර 12 | 62,595/- |

සටහන: වැටුප් ගෙවීම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි විධිවිධානයන්ට අනුකූල වේ.

06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු :

6.1. අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| තීරුබදු විශ්ලේෂක | III/II | 02 | තීරුබදු ප්‍රතිපත්තිය සම්පාදනයෙහිලා දායකවීම හා එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විමර්ශනයන් හා විශ්ලේෂණය කිරීම, වාර්තා සම්පාදනය, තීරුබදු සම්බන්ධිත සමීක්ෂණයන් හා ඒ අනුව සැළසුම් කිරීම.<br><br>අන්තර්ජාතික වශයෙන් පවත්නා සංයෝජිත වර්ගීකරණ සංකේතාංක හා ඊට අදාල භාණ්ඩ වර්ගීකරණය කිරීම, දේශීය වශයෙන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය, අවශ්‍ය පරිදි විවිධ භාණ්ඩයන් වර්ගීකරණයට අදාල සංයෝජිත වර්ගීකරණ සංකේතාංක නිර්මාණය කිරීමට අවශ්‍ය නිරීක්ෂණ හා නිර්දේශ ලබා දීම හා එම තොරතුරු ඇතුලත් ලැයිස්තු හා ගැසට් පත්‍ර පිළියෙල කිරීම සහ බදු නිදහස් කිරීමේ යෝජනාක්‍රම සකස්කිරීම ද ඇතුලත් ව අපේක්ෂිත අරමුණු ලඟාකර ගැනීමේ කාර්යයේදී අදාළ වන්නාවූ කාර්යයන්. |

6.2. ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව: 02

සටහන: ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේදී III, II ශ්‍රේණි සියල්ලම ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

07. බඳවා ගැනීමේ ක්‍රමය :

7.1. බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | - |
| සීමිත | 100 % |
| කුසලතා | - |

7.2. විවෘත බඳවා ගැනීම : අදාල නොවේ.

7.3. සීමිත බඳවාගැනීම :

7.3.1. බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.3.2. සුදුසුකම් :

7.3.2.1. අධ්‍යාපන සුදුසුකම් : විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ආර්ථික විද්‍යාව හෝ කළමනාකරණය පිළිබඳ විශේෂවේදී උපාධියක් ලබා තිබීම

හෝ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ආර්ථික විද්‍යාව හෝ කළමනාකරණය විෂයයන් සහිත සාමාන්‍ය උපාධියක් සහ ආර්ථික විද්‍යාව හෝ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ ඊට ඉහළ සුදුසුකමක් ලබා තිබීම.

7.3.2.2. වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

7.3.2.3. පළපුරුද්ද : රාජ්‍ය සේවයේ MN-02 හෝ ඊට ඉහළ වැටුප් කේතයක් යටතේ වැටුප් ලබන තනතුරක වසර 10ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු වීම.

(තීරුබදු හා අනෙකුත් ආනයන බදු වර්ග හා ඒවා ක්‍රියාත්මක කරවීම පිළිබඳ වන කාර්යයන් ඉටුකිරීම සම්බන්ධව වන සේවා පළපුරුද්ද සඳහා යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු ලැබේ.)

7.3.2.4. කායික සුදුසුකම් : ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.

7.3.2.5. වෙනත් :

i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

ii. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.3.2 සිට 7.3.3. දක්වා සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

iv. උසස්වීම් ලබන දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

v. අයදුම්පත් කැඳවන නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

7.3.3. වයස : අදාල නොවේ.

7.3.4. බඳවා ගැනීම් ක්‍රමය : ලිඛිත පරීක්ෂණයේ හා යෝග්‍යතාව ඇගයීමේ පරීක්ෂණයේ ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

7.3.4.1. ලිඛිත විභාගය :

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1.තීරුබදු විශ්ලේෂණය | 100 | 40% |
| 2.අන්තර් ජාතික වෙළඳ ගිවිසුම් | 100 | 40% |

විෂය නිර්දේශය ඇමුණුම 01 හි දැක්වේ.

7.3.4.1.1 පවත්වන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

7.3.4.2. වෘත්තීය පරීක්ෂණය : අදාල නොවේ.

7.3.4.3. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය

| අනු අංකය | පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | බදු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සම්බන්ධව වන සේවා පළපුරුද්ද (විස්තරාත්මක ලකුණු පරිපාටියේ ලකුණු ලබාදෙනු ලබන කාර්යයන් සඳහන් කරනු ලැබේ) | 15 | අදාල නොවේ |
| 2 | අතිරේක අධ්‍යාපන සුදුකම් | 15 | |
| 3 | ක්ෂේත්‍රයට අදාලව ලබාගෙන ඇති පුහුණුවීම් සහ වෙනත් සුදුසුකම් | 05 | |
| 4 | භාෂා ප්‍රවීනතාවය | 05 | |
| 5 | පරිගණක හැකියාව | 05 | |
| 6 | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා | 05 | |

සටහන:

1. ලිඛිත විභාගය සමත් අදාළ සුදුසුකම් සම්පූර්ණ කරන ලද අපේක්ෂකයන්ගේ ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව එක් එක් තනතුරට බඳවා ගන්නා ප්‍රමාණය මෙන් දෙගුණයක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එම පරීක්ෂණයේදී අපේක්ෂිතයන්ට ලබාදුන් ලකුණු ලිඛිත විභාගයේදී ලබාගත් ලකුණු වලට එකතු කළ විට ලැබෙන මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනේ.

2. ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, එක් එක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පටිපාටියක් අනුමත කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ඇත.

7.3.4.3.1. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

7.3.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය: රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පල කිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පල කිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පල කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.4 .කුසලතා පදනම මත බඳවාගැනීම : අදාල නොවේ.

8. කාර්යක්ෂමතා කඩඉම්

8.1.

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ ස්වාභාවය |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | III වන ශ්‍රේණියට ඇතුලත්ව වසර තුනක් (03) ගත වීමට පෙර | ලිඛිත විභාගයකි |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | II වන ශ්‍රේණියට ඇතුලත්ව වසර තුනක් (03) ගත වීමට පෙර | විස්කෘත නිබන්ධනයකි |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | I වන ශ්‍රේණියට ඇතුලත්ව වසර පහක් (05) ගත වීමට පෙර | ධාරිතා සංවර්ධන පුහුණුවකි |

8.2. කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද: වසරකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාල පරීක්ෂණ පවත්වනු ලබන බලධරයින් කවුරුන්ද:

1 වන කාර්යක්ෂමතා කඩඉම : විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

2 වන කාර්යක්ෂමතා කඩඉම : විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

3 වන කාර්යක්ෂමතා කඩඉම : දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පත් කරනු ලබන කමිටුවක් මඟින්

9. භාෂා ප්‍රවීණතාව

9.1.

| භාෂාව | ලබා ගතයුතු ප්‍රවීණතාව |
|---|---|
| 01. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුලදී ලබා ගත යුතුය. |
| 02. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාල මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

10. ශ්‍රේණි උසස් කිරීම

10.1. III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම

10.1.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1. සපුරාලිය යුතු සුදුසුකම්

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10)ක් උපයාගෙන තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10)ක් තුල සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීනතාව ලබාගෙන සිටීම.

VI. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2. උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.2. II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම

10.2.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.2.1.1. සපුරාලිය යුතු සුදුසුකම්

I. පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් පශ්චාත් උපාධියක්

II. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර හත (07) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හත (07) ක් උපයාගෙන තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හත (07) තුළම සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව තිබීම.

10.2.1.2. උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධාරියා විසින් සිදු කරනු ලැබේ.

සංලක්ෂය

සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කල යුතුය.

11. තනතුරු වලට පත් කිරීම : අදාල නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නාවූ කොන්දේසි : අදාල නොවේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපන වලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ : "සක්‍රීය සේවා කාලය" යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රීය සේවා කාලයක් ලෙස සැලකිය

යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුළත් නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහනය : අදාල නොවේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීති වල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාල වේ.

16. මෙම බඳවා ගැනීම පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17. අන්තර්කාලීන විධිවිධාන : අදාල නොවේ.

සකස් කලේ : අත්සන ..................................

(විෂය භාර කනිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම : ඩබ්. පී. එම්. ... පරිපාලන නිලධාරි
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

තනතුර :

දිනය : 2018.11. 28

පරීක්ෂා කලේ : අත්සන ..................................

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : දර්ශන විජේසිරිවර්ධන
අධ්‍යක්ෂ
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

තනතුර :

දිනය : 2018.11. 30

නිර්දේශ කර ඉදිරිපත් කිරීම.

අත්සන ..................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : සී. ජයසූරිය

තනතුර : අධ්‍යක්ෂ ජනරාල්
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

නිල මුද්‍රාව :

දිනය : 2018.11. 30

යොමු අංකය : MF/01/01/03

2018.11.01 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ තීරුබදු විශ්ලේෂක තනතුර සඳහා වන මෙම බඳවාගැනීමේ පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කරමි.

අත්සන ..................................

නම :

ලේකම්

මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

දිනය : 14/12/2018

නිල මුද්‍රාව :

එස්. ආර්. ආටිගල
මහා භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්
මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය
කොළඹ 01.

යොමු අංකය : PSC/EST/05-01-02/04/2018

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ තීරුබදු විශ්ලේෂක තනතුර සඳහා වන මෙම බඳවාගැනීමේ පටිපාටිය 2018.11.01 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන ..............................

නම : එම්.ඒ.බී. දයා සෙනරත්

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

එම්. ඒ. බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නො. 1200/9. රජමල්වත්ත පාර
බත්තරමුල්ල.

දිනය -: 2019.01.01

14/2018

ඇමුණුම 01

සඳහා
නුමත

01. විභාගයේ නම : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ තීරුබදු විශ්ලේෂක තනතුර සඳහා බඳවාගැනීමේ සීමිත තරඟ විභාගය

02. විභාගය පිළිබඳ විස්තර : ලිඛිත පරීක්ෂණය

| ප්‍රශ්න පත්‍රය | කාලය (පැය) | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. තීරුබදු විශ්ලේෂණය | 2 | 100 | 40 |
| 2. අන්තර්ජාතික වෙළඳ ගිවිසුම් | 2 | 100 | 40 |

03. පවත්වනු ලබන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග පමණි. : පුරප්පාඩු පවතින අවස්ථා වලදී

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1.තීරුබදු විශ්ලේෂණය | 1.1 වර්තමාන තීරුබදු ව්‍යුහයේ විකාශනය, එහි සැකැස්ම හා රාජ්‍ය ආදායමට ඇති දායකත්වය<br>1.2 තීරුබදු ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය හා ඊට අදාල නීතිමය රාමුව<br>1.3 තීරුබදු අයකිරීමේ හා නිදහස් කිරීමේ ක්‍රමවේදය<br>1.4 තීරුබදු නිදහස් කිරීමේ විවිධ යෝජනා ක්‍රම<br>1.5 ආනයන හා අපනයන වෙළඳාමේදී තීරුබදු සමගාමීව ක්‍රියාත්මක වන අනෙකුත් බදු වර්ග පිළිබඳ විමර්ශනය |
| 2.අන්තර්ජාතික වෙළඳ ගිවිසුම් | 2.1 ශ්‍රී ලංකාවේ අන්තර් ජාතික වෙළඳාම සම්බන්ධයෙන් ලෝක වෙළඳ සංවිධානය සමඟ ඇති බැඳීම් හා ඒ හා සම්බන්ධ ක්‍රියාකාරීත්වයන්<br>2.2 ශ්‍රී ලංකාවේ ද්වීපාර්ශවික වෙළඳ ගිවිසුම් හා ඒවායේ තීරුබදු සංශෝධනය ඇතුලු අන්තර්ගතයන්<br>2.3 ශ්‍රී ලංකාවේ බහුපාර්ශවික වෙළඳ ගිවිසුම් හා ඒවායේ තීරුබදු සංශෝධනය ඇතුලු අන්තර්ගතයන්<br>2.4 ඉදිරියේදී එළඹීමට ඇති වෙළඳ ගිවිසුම් හා ඒවායේ අවශ්‍යතාව<br>2.5 අනතර්ජාතික වෙළඳ ගිවිසුම් මගින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ඇති කරන බලපෑම, වාසි අවාසි පිළිබඳ විමර්ශනය |

සකස් කළේ : අත්සන ..........
නම : ජේ. සී. ප්‍රසාද් චන්දන
තනතුර : පරිපාලන නිලධාරී
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.
දිනය : 2018.11.01

පරීක්ෂා කළේ : අත්සන ..........
නම : දර්ශන විජේසිරිවර්ධන
අධ්‍යක්ෂ
තනතුර : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.
දිනය : 2018.11.01

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : සී. ජයසූරිය
තනතුර : අධ්‍යක්ෂ ජනරාල්
නිල මුද්‍රාව : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

ඇමුණුම 02

01. විභාගයේ නම : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ තීරුබදු විශ්ලේෂක තනතුර සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය

02. විභාගය පිළිබඳ විස්තර : ලිඛිත පරීක්ෂණය

| ප්‍රශ්න පත්‍රය | කාලය (පැය) | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. මුදල් රෙගුලාසි | 01 | 100 | 40 |
| 2. කාර්යාල ක්‍රම | 01 | 100 | 40 |

03. පවත්වනු ලබන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. මුදල් රෙගුලාසි | 1. පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයක්<br>(අ). ආණ්ඩුවේ මුදල් රෙගුලාසි, (X වැනි පරිච්ඡේදය හැර)<br>(ආ). ප්‍රවර්තන වර්ෂයේ ඇස්තමේන්තු ඒවා සකස් කිරීම, ආදායම් හා වියදම් ශීර්ෂ හා විසර්ජන පනත මූලා පිළිබඳව |
| 2. කාර්යාල ක්‍රම | 1. පහත සඳහන් කරුණු මත පදනම් වූ එක් ප්‍රශ්න පත්‍රයක්<br>(අ). ආයතන සංග්‍රහය පරිච්ඡේද I, II, III, V, VI, VII, IX, XXIX, XXX, XXXIII, XLVII සහ XLVIII<br>(ආ). රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහය |
| 3. ක්ෂේත්‍රයේ දැනුම | 1. කාලීනව වෙළඳ හා තීරුබදු ව්‍යුහයේ ඇතිවන වෙනස්කම්<br>(අ). නව වෙළඳ ගිවිසුම් හා ඒවායේ එකඟතාවයන් කවරේද යන්න<br>(ආ). තීරුබදු ව්‍යුහයේ සිදු වී ඇති වෙනස්කම්<br>(ඇ). ආනයන බදු ව්‍යුහයේ කාලීනව වෙනස්කම් සිදුකිරීම මගින් ජාතික ආර්ථිකයට සිදුවී ඇති බලපෑම් |

සකස් කළේ : අත්සන ..............................
නම :
තනතුර :
දිනය : 2018.11.26

ඒ. ඒ. පී. ප්‍රසාද් චන්දන
පරිපාලන නිලධාරී
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

පරීක්ෂා කළේ : අත්සන ..............................
නම : දර්ශන විජේසිරිවර්ධන
තනතුර : අධ්‍යක්ෂ
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
දිනය : 2018 මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..............................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :
තනතුර :
නිල මුද්‍රාව :

සී. ජයසූරිය
අධ්‍යක්ෂ ජනරාල්
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

ක්‍රම 02

ඇමුණුම 03

සේවා

01. විභාගයේ නම : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ තීරුබදු විශ්ලේෂක තනතුර සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

02. විභාගය පිළිබඳ විස්තර : විස්තෘත නිබන්ධනයක්

03. පවත්වනු ලබන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය : වෙළඳ හා තීරුබදු ප්‍රතිපත්ති පිළිබඳ ඉංග්‍රීසි මාධ්‍යයෙන් සකසන ලද වචන 15000කට නොඅඩු විස්තෘත නිබන්ධනයක්

සකස් කළේ : අත්සන ..................................

නම :

තනතුර ජ්. ඒ. පී. ප්‍රසාද් චන්දන

දිනය පරීක්ෂක නිලධාරී 2018.11.22

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

මහා භාණ්ඩාගාරය

කොළඹ 01

පරීක්ෂා කළේ : අත්සන ..................................

නම : දර්ශන විජේසිරිවර්ධන

අධ්‍යක්ෂ

තනතුර වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

දිනය : 2018. මහා භාණ්ඩාගාරය

කොළඹ 01.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..................................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :

තනතුර :

නිල මුද්‍රාව :

සී. ජයසූරිය

අධ්‍යක්ෂ ජනරාල්

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

මහා භාණ්ඩාගාරය

කොළඹ 01.

ඇමුණුම 04

01. විභාගයේ නම : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ තීරුබදු විශ්ලේෂක තනතුර සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

02. විභාගය පිළිබඳ විස්තර : ධාරිතා සංවර්ධන පුහුණුවක් සම්පූර්ණ කිරීම

03. පවත්වනු ලබන බලධරයා : දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පත් කරනු ලබන කමිටුවක් මගින්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : අදාල නොවේ

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

1. පුද්ගල සංවර්ධනය
2. තොරතුරු තාක්ෂණ කළමනාකරණය
3. මූලික නෛතික විධිවිධාන
4. ඵලදායීතා සංකල්ප

...ත විජේසිරිවර්ධන
අධ්‍යක්ෂ
...ජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

සකස් කළේ : අත්සන ..............................
නම : ජී. ජී. ...
තනතුර : පරිපාලන නිලධාරි
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01
දිනය : 2018.11.26

පරීක්ෂා කළේ : අත්සන ..............................
නම :
තනතුර :
දිනය : 2018.11.30

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..................................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :
තනතුර :
නිල මුද්‍රාව :

සී. ජයසූරිය
අධ්‍යක්ෂ ජනරාල්
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.